# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1942/26 – 2015 නොවැම්බර් 27 වැනි සිකුරාදා – 2015.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොම්පාරිප්පුපත්තුව සුළු කොට්ඨාසයේ, කරදිපුවල් (කොටසක්) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Pu/Vnt/2014/154 හා 2014.07.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 4.0090ක් පමණ වන පහත නම සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර ''ඒ'' – වීරකුලිච්චෝලෛයි වත්ත – ප්‍රමාණය: හෙක්. 4.0090ක් පමණ

උතුරට: කරත්ත පාර; නැගෙනහිරට: එෆ්ටීපී 22හි කැබලි අංක 1821; දකුණට: එෆ්ටීපී 22හි කැබලි අංක 1826, 1827 සහ 1828; බටහිරට: එෆ්ටීපී 22හි කැබලි අංක 1819.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2013/ඩබ්ලිව්ආර්/602.
2015 සැප්තැම්බර් මස 25 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 – 441



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙව්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාඔටුන්න ගමේ පිහිටි මාතර දිස්ත්‍රික් ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක එම්ආර්/ඩීවීඑන්/2014/237 හා 2014.10.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 2.3033ක් පමණ වන ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අක්ෂර ''ඒ'' – ගොරකපදුරහේන නොහොත් ගොරකගහහේන, බබියලගෙකුරුඳුවත්ත සහ වෙලන්කැටිය – ප්‍රමාණය: හෙක්. 2.3033**

උතුරට: අමරතුංග පලිහක්කාර හිමිකම් කියන වෙලන්කැටියවත්ත, සුජීව අබේවික්‍රම හිමිකම් කියන දොඩම්පහළ වත්ත සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය; දකුණට: වාරිමාර්ග ඇළ; බටහිරට: වාරිමාර්ග ඇළ සහ ඩී. ඊ. දේපළ වෙළඳාම හිමිකම් කියන ජය උයන.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

යොමු අංකය: 4-3/15/2014/වීඊ/108.
2015 සැප්තැම්බර් මස 25 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 – 442

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.